# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 68 — 1973 ජූලි 13 වැනි සිකුරාදා — 1973.07.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 727 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 723 | මිළ පාලන දැන්වීම් ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... | 725 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය ... | — | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 725 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 731 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... | — | "සුරාබදු අණපනත" පිළිබඳ දැන්වීම් ... | — |


සැළකිය යුතුයි.—(i) බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ජූනි 29 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. (ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 21 දරන මුද්දර (සංශෝධන) පනත 1973 ජූලි 13 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ., (iii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් ද පළවේ.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 337**

අංකය: ඩී. 250/ආර්ජීසීව්/3 (III).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 ජූනි මස 01 දින සිට මේජර් වශයෙන් :—

කපිතාන් එන්. ඊ. ද සිල්වා, ලයුසෙවෙබ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩී. ඊ. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 30 දින,
කොළඹ දී ය.

7-332—73.07.13 වැනි දින අංක 68 දරන ගැසට් පත්‍රය.

**1973 අංක 338**

අංකය: ඩී. 250/ආර්ජීසීව්/3 (III).

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 මාර්තු මස 15 දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතාන් ඊ. පරණගම, ලසසබ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩී. ඊ. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 30 දින,
කොළඹදී ය.

7-331—73.07.13 වැනි දින අංක 68 දරන ගැසට් පත්‍රය.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සංඛ්‍යා සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**


723—බී 70940—10,662 (73/7)

1973 අංක 339

අංකය : සී/වීඑෆ්/42 (III).

ශුද්ධ හමුදුව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීම්

1966 ජනවාරි මස 1 වැනි දින සිට කපිතාන් වශයෙන් :—

ලුතිනන් (තාවකාලික කපිතාන්) වලිමුනි තෝමස් හෙන්රි මැන් ඩිස්, ලංජාආමු.

1967 ජූනි මස 1 වැනි දින සිට කපිතාන් වරුන් වශයෙන් :—

ලුතිනන් (තාවකාලික කපිතාන්) සමරරත්න විදාන-ආරච්චිලාගේ රත්නපාල සේනාරත්න, ලංජාආමු.

ලුතිනන් (තාවකාලික කපිතාන්) කත්බර්ට් රසල් රේමන්, ලංජාආමු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි 25 දින,
කොළඹ දී ය.

7-316—73.07.13 වැනි දින අංක 68 දරන ගැසට් පත්‍රය.

---

1973 අංක 340

අංකය : සී/වීඑෆ්/42 (III).

ශුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු සේවයට මාරුකිරීම්

1971 අප්‍රේල් මස 1 වැනි දින සිට, පහත සඳහන් නිලධාරීන් ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු උපසේවයට මාරු කරන ලදි :—

ලුතිනන් දොන් ස්ටැන්ලි සේනානායක සෙනෙවිරත්න, ලංජාආමු
ලුතිනන් ඒලියන් ලින් ස්මිත්, ලංජාආමු
ලුතිනන් හොරලියස් මර්ල් ඩයස් වික්‍රමනායක ජයසිංහ, ලංජාආමු

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 25 දින,
කොළඹ දී ය.

7-437—73.07.13 වැනි දින අංක 68 දරන ගැසට් පත්‍රය.

---

1973 අංක 341

අංකය : සී/වීඑෆ්/22/ඒ (III).

ශුද්ධ හමුදුව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1973 අප්‍රේල් මස 01 වැනි දින සිට ලුතිනන් වශයෙන් :—

දෙවන ලුතිනන් මොහමඩ් පලීල් අබ්දීන්, ලසිරෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 25 දින,
කොළඹ දී ය.

7-442—73.07.13 වැනි දින අංක 68 දරන ගැසට් පත්‍රය.

---

1973 අංක 342

අංකය : සී/වීඑෆ්/77.

ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදුව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස්වීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට කෙලින් සඳහන් කර ඇති දින සිට ස්ථිර ස්කොඩ්රන් ලීඩර්වරුන් වශයෙන් :—

1. තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ප්‍රසන්නතිස්ස හරිස්චන්ද්‍ර අමරසිංහ (වී/0051)—වෛද්‍ය—1972 ජූලි 1 සිට
2. තාවකාලික ස්කොඩ්රන් ලීඩර් සින්නතම්බි කන්දයියා මහේස්වරන් (වී/0052)—වෛද්‍ය—1973 ජනවාරි 1 සිට

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 28 වැනි දින,
කොළඹ දීය.

7-309/1—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 343

අංකය : සී/වීඑෆ්/77

ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදුව—උසස් කිරීම

(1) 1972 ඔක්තෝබර් මස 23 වැන දින සිට ෆ්ලයිං ඔෆිසර්වරුන් වශයෙන්—

පයිලට් ඔෆිසර්, තලවිල විතානගේ දෙන් හර්බට් කරුණාතිලක (වී/0004)—පොදු රාජකාරි (නියමු)
පයිලට් ඔෆිසර්, රාජමනෝහරන් කදිරාමතම්බි කුමාරසූරියර් (වී/0011)—ගගන යාත්‍රාංගන ඉදිකිරීම් අංශය (වැඩ සේවා)
පයිලට් ඔෆිසර්, රොබට් සිරිවර ලියනගේ (වී/0012)—ගගන යාත්‍රාංගන ඉදිකිරීම් අංශය (වැඩ සේවා)
පයිලට් ඔෆිසර්, ලක්ෂමන් ගාමිණී විජේසිංහ (වී/0020)—පාලන ශාඛාව
පයිලට් ඔෆිසර්, ඇලෙක්සැන්ඩර ලක්දස ධනපාල මුනමලේ (වී/0022)—පාලන/රෙජිමේන්තු
පයිලට් ඔෆිසර්, ජයරාජා වින්ස්ලෝ (වී/0025)—කාර්මික/ඉංජිනේරු

(2) 1972 නොවැම්බර් මස 02 වැනි දින සිට ෆ්ලයිං ඔෆිසර්වරුන් වශයෙන්—

පයිලට් ඔෆිසර්, රංජිත් ජයතිස්ස ගුණවර්ධන (වී/0040)—පාලන/රෙජිමේන්තු
පයිලට් ඔෆිසර්, තුවාන් රාජිලුන් සිංග ලක්ෂානා (වී/0044)—පාලන/උපකරණ
පයිලට් ඔෆිසර්, ඇන්තනි බෙවිස් ද සිල්වා (වී/0046)—පොදු රාජකාරි (නියමු)

(3) 1972 නොවැම්බර් මස 30 වැනි දින සිට ෆ්ලයිං ඔෆිසර්වරුන් වශයෙන්—

පයිලට් ඔෆිසර්, එඩ්වඩ් පර්සිවල් නතානියල්ස් (වී/0053)—පාලන/රෙජිමේන්තු
පයිලට් ඔෆිසර්, රත්නජීව නෙත්තානන්ද පෙරේරා (වී/0054)—පාලන/රෙජිමේන්තු
පයිලට් ඔෆිසර්, පතිරන්නැහෙලාගේ ආරියසිංහ සමරවීර (වී/0055)—පාලන රෙජිමේන්තු
පයිලට් ඔෆිසර්, මහේෂ් ජිනේන්ද්‍ර ආරිය ගුණසේකර (වී/0058)—පාලන රෙජිමේන්තු

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 28 වැනි දින,
කොළඹ දීය.

7-309/2—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 344**

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම් කර ඇත:—

අංකය: රාසේ/උ/8/73.

ඒ. බී. වික්‍රමනායක මහතා 1973 මාර්තු මස 13 වැනි දින සිට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන්.

අංකය: රාසේ/උ/6/73.

කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජී. එස්. ජයමහ මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ. ඩී. එන්. ද සිල්වා මහතා 1972 දෙසැම්බර් මස 11 වැනි දින සිට කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

අංකය: අම/දිසාප/1/72.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා 1973 ජනවාරි මස 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ගාල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන්.

අංකය: අම/දිසාප/1/72.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පන්තියේ එස්. ජේ. සුමනසේකර බණ්ඩා මහතා 1973 ජනවාරි මස 01 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මොණරාගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන්.

අංකය: රාසේ/උ/2/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ එල්. පී. වික්‍රමාරච්චි මහතා 1973 පෙබරවාරි මස 05 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, වවුනියා පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන්.

අංකය: රාසේ/උ/7/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ ඩබ්ලිව්. ඒ. ඩී. එස්. ඩී. සපරමාදු මහතා 1973 මැයි මස 07 වැනි දින සිට නාවික කටයුතු හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ වැඩබලන අතිරේක ලේකම් වශයෙන්.

අංකය: රාසේ/උ/7/73.

සත්වෛද්‍යාන අධ්‍යක්ෂ ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස් මහතා 1972 නොවැම්බර් මස 11 වැනි දින සිට 1972 නොවැම්බර් මස 24 වැනි දින දක්වා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ වී. සිවසම්බු මහතා තම රාජකාරියන්ට අමතරව සත්වෛද්‍යාන අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරියන්හි යෙදීමට.

අංකය: රාසේ/උ/9/73.

වැඩබලන සුළු අපනයන බෝග අධ්‍යක්ෂ ආචාර්ය එඩ්වින් ජය නෙත්ති මහතා 1971 ඔක්තෝබර් මස 15 වැනි දින සිට සුළු අපනයන බෝග අධ්‍යක්ෂ වශයෙන්.

අංකය: රාසේ/උ/1/73.

අතිරේක නීති කෙටුම්පත් සම්පාදක බී. එම්. ද අල්විස් මහතා 1972 දෙසැම්බර් මස 24 වැනි දින සිට නීති කෙටුම්පත් සම්පාදක වශයෙන්.

අංකය: අම/ජොසලේ/ප/1/72.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ ඩබ්ලිව්. ගුණසේකර මහතා 1972 ඔක්තෝබර් මස 10 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් හා තම රාජකාරියන්ට අමතරව පොල් හා කොකෝවා වැවීම නගාසිටුවීමේ කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

අංකය: අම/දෙප්‍රප/2/72.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ ටී. බාලසුබ්‍රමනියම් මහතා 1971 දෙසැම්බර් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ ඌව දිසාවේ වැඩ අධ්‍යක්ෂ වශයෙන්.

**අංකය: අම/දෙප්‍රප/3/72.**

යන්ත්‍රෝපකරණ අධ්‍යක්ෂ එස්. මුදලිගේ මහතා 1972 සැප්තැම්බර් මස 09 වැනි දින සිට 1972 ඔක්තෝබර් මස 11 වැනි දින දක්වා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III පන්තියේ වී. එම්. කරුණාරත්න මහතා තම රාජකාරිවලට අමතරව, යන්ත්‍රෝපකරණ අධ්‍යක්ෂ තනතුරේ රාජකාරිවල යෙදීමට.

එම්. එස්. අලිෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1,
1973 ජූනි මස 27 දින.

7-446—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

# වෙනත් පත්කිරීම් ආදිය

**1973 අංක 345**

පා 4/2/19.
පා 4/1/2/73 (දි)
පා 4/1/2/4/73 (වං)
පා 4/1/5/11/73 (වං)
පා 4/1/3/29/73.
පා 4/1/4/13/73 (වං)
පා 4/1/7/25/73 (වං)
පා 4/1/15/57/73 (වං)
පා 4/1/16/64/72 (වං)
පා 4/1/26/88/73.
පා 4/1/28/101/73.
පා 4/1/32/117/73.
පා 4/1/35/128/73 (වං)

**අධිකරණ ආඥාපනත**

(6 වන අධිකාරිය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 සහ 83 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම,

1. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් කේ. රත්නසභාපති මහතා එම ධුරය දරණ කාලය තුල ශ්‍රී ලංකාවේ සියලුම අධිකරණ දිස්ත්‍රික්කයන් සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
2. නීතිඥ බෝල්ටන් සෙනෙවිරත්න මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු සහ නිල නොලත් මහේස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,
3. නීතිඥ ඩී. ආර්. බී. දුර්ගාහක්ෂි මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,
4. මොහොමඩ් අලි මොහොමඩ් බාකීර් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
5. අල්හාජ් අබ්දුල් රහුමාන් මොහොමඩ් ජුනයිඩ් මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
6. උඩුවර මෙරඤ්ඤගේ රොමානිස් ද සිල්වා මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
7. දේමුනි ද සිල්වා කුලරත්න මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
8. කලුගොඩගේ ලූකස් ප්‍රනාන්දු මහතා මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
9. කමෙල් මාතර ආරච්චි මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
10. බී. නාගොඩ විතාන මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
11. කපුගම ගිගනගේ සමරජීව මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
12. මොහොම්මඩ් ඊබ්‍රාහිම් මොහමඩ් රාවුප් හාජියාර් මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
13. කනපත්තොලාක් සයිමන් මහතා ත්‍රිකුණාමලය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
14. නහා අබ්දුල් රසාක් මහතා ත්‍රිකුණාමලය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

### 1973 අංක 347

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

බියන්විල පදිංචි ලිහිණිකඩු ආරච්චිගේ දොන් අයිසැක් විමලවීර මහතා බියන්විල වාසස්ථානය සහ කාර්යාලය ද ගණේමුල්ලේ අතුරු කාර්යාලය ද ඇතුළු ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ ජූනි මස 23 දින,
කොළඹ දී ය.

7—413 –73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 348

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ගලේවෙල දඹුලු පාරේ පදිංචි ලිහිණිකඩු ආරච්චිගේ සීතා හේම කාන්ති විමලවීර මෙනෙවිය ගලේවෙල දඹුලු පාරේ වාසස්ථානය සහ කාර්යාලය ද වහකෝට්ටේ අතුරු කාර්යාලය ද ඇතුව මාතලේ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක්වූ ජූනි මස 23 දින,
කොළඹ දී ය.

7-405—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නිවේදන

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මෙහි උපලේඛනයේ II වැනි තීරුවේ දක්වා ඇති රාජ්‍ය නිලධාරීන්හට I වැනි තීරුවේ දක්වා ඇති නිලධාරීන් සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල හා විනය පාලනය පිළිබඳ බලතල, ආයතන සංග්‍රහයේ නියමිත ක්‍රියා පරිපාටියට සහ රජය විසින් වරින් වර පණවනු ලබන වෙනත් ඕනෑම උපදෙස්වලට අනුකූලව එම බලතල ක්‍රියාවේ යෙදවිය යුතුය යන කොන්දේසියට යටත්ව මෙයින් පවරා දෙමි.

| I වැනි තීරුව | II වැනි තීරුව |
|---|---|
| රු. 6,720 කට අඩු ආරම්භක වාර්ෂික වැටුප් පරිමාණයක් හිමි ඒකාබද්ධ සේවාවන්ට අයත් ඕනෑම රාජ්‍ය නිලධාරියෙක්. | රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කවර හෝ සාමාන්‍ය සහ විශේෂ උපදෙස්වලට යටත්ව, …… |
| | II වැනි තීරුව |
| | එම අවස්ථාවේදී නිලධාරියා සේවයේ නියුක්ත දෙපාර්තමේන්තු ප්‍රධානියා. |

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1973 ජූලි මස 04 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

7-505 —73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### 1961 අංක 62 දරණ වෙළඳුන්ට බලපත්‍ර දීමේ පනත

1973 අප්‍රේල් මස 11 වැනි දින අංක 54/5 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1973 (අංක 3) වෙළඳ බලපත්‍ර දීමේ නියෝග ජාතික රාජ්‍ය සභාව විසින් 1973 ජූනි 7 වැනි දින අනුමත කර ඇති බව සාමාන්‍ය දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. බී. කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 ජූලි මස 3 වැනි දින,
කොළඹ දී ය.

7-444 —73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය ප්‍රතිසංස්ථාපනය කිරීම

මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය 1973 ජූලි මස 1 වැනිදා සිට,

1. නානාට්ටන්
2. මුසලි වශයෙන් ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශ දෙකකට ප්‍රතිසංස්ථාපනය කරණ ලද බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. (අ) නානාට්ටන් ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය මෙහි පහත සඳහන් ග්‍රාමසේවක කොට්ඨාශවලින් සමන්විත වේ :—

| කොට්ඨාශ අංකය | කොට්ඨාශයේ නම |
|---|---|
| 195 | වෙන්කලි |
| 196 | පෙරියකඩ්ඩෛකාඩු |
| 197 | නානාට්ටන් |
| 197 ඒ | නරුවිලිකුලම් |
| 204 | මුරුන්කන් |
| 205 | පුලියාඩිඉරකම් |
| 206 | පනන්වෙඩ්ඩුවන් |
| 206 ඒ | පෙරියමුරිප්පු |

(ආ) මුසලි ආදායම් නිලධාරී කොට්ඨාශය මෙහි පහත සඳහන් ග්‍රාමසේවක කොට්ඨාශවලින් සමන්විත වේ :—

| කොට්ඨාශ අංකය | කොට්ඨාශයේ නම |
|---|---|
| 198 | අරිප්පු |
| 199 | මේතන්වලි |
| 200 | අකතිමුරිප්පු |
| 201 | සිලාවතුර |
| 202 | කොන්ඩපඩ්යාන් |
| 203 | මරිච්චිකඩ්ඩි |

3. පහත සඳහන් පළාත් පාලන ආයතනයන් ඒ ඒ ප්‍රා. ආ. නි. කොට්ඨාශවලට අඩංගු වනවා ඇත :—

(අ) නානාට්ටන් ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය :—

(1) වන්කාලේ ගම් කාර්‍ය සභාවේ අංක 01 සිට අංක 10 දක්වා වූ කොට්ඨාශ
(2) නැගෙනහිර නානාට්ටන් ගම් කාර්‍ය සභාව
(3) බටහිර නානාට්ටන් ගම් කාර්‍ය සභාවේ අංක 01 සිට අංක 12 දක්වා වූ කොට්ඨාශ

(ආ) මුසලි ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය—

(1) උතුරු මුසලි ගම්කාර්‍ය සභාවේ අංක 01 සිට අංක 09 දක්වා වූ කොට්ඨාශ.
(2) දකුණු මුසලි ගම්කාර්‍ය සභාවේ අංක 01 සිට අංක 10 දක්වා වූ කොට්ඨාශ.

4. එක් එක් අළුත් කොට්ඨාශය තුල අධිකරණ බලය මෙහි පහත සඳහන් ගම්බද උසාවි මගින් ක්‍රියාත්මක වේ :—

(අ) නානාට්ටන් ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය නානාට්ටන්හි හා මුරුන්කන්හි සැසි වාර පැවැත්වෙන මන්නාරම ගම්බද උසාවිය
(ආ) මුසලි ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය පොච්කර්නියි සැසිවාර පැවැත්වෙන මන්නාරම් ගම්බද උසාවිය

5. නානාට්ටන් හා මුසලි ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශ දෙක මන්නාරම මැතිවරණ කොට්ඨාශයට ඇතුලත් වේ.

6. මෙම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශවල කාර්‍යාල පහත සඳහන් ස්ථානවල පිහිටුවනු ලැබේ :—

(1) නානාට්ටන් ප්‍රා. ආ. නි. කාර්‍යාලය—නානාට්ටන්
(2) මුසලි ප්‍රා. ආ. නි. කාර්‍යාලය—සිලාවතුර

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූලි මස 2 වෙනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

7-445—73.07.12 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 වැනි ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජේරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1973 ජුනි 22 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ආදායම් නිලධාරි කොට්ඨාශයේ හොරේතුඩුව ග්‍රාමසේවක කොට්ඨාශයේ මඩකිස්ස පාරේ වරිපනම් අංක 105 දරණ දෙල්ගහවත්ත නමැති පහත සඳහන් මායිම් ඇති අක්කර 3 ක් පමණ ඉඩම :—

උතුරට : දෙල්ගහවත්ත නමැති මෙම ඉඩමේම කොටසක් ;

නැගෙනහිරට : වැව ;

දකුණට : වැව ;

බස්නාහිරට : වැව සහ ඩී. ඊ. සමරසේකර යන අයගේ ඉඩම.

7-345—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 වැනි ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජේරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

සාපාශා 6/අත්දෙවු/3
1973 ජුනි 22 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයේ හෙනරත්ගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයේ පිහිටි කමත්ගොඩැල්ල නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 4 ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : ඇස්. ඩී. කලුගම්පිටියට අයිති ගොඩැල්ලවත්ත ;

නැගෙනහිරට : ඊරියගහවත්ත, සාමෙල්ගේ වත්ත සහ කහටගහ වත්ත ;

දකුණට : මරදගහවත්ත ;

බස්නාහිරට : ගම්සභා පාර.

7-346—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජේරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වැනි ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වැනි ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

සාපාශා/අත්/132,
1973 ජුනි 22 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව උප දිසාපති කොට්ඨාශයේ උඩුමුල්ල ග්‍රාමයේ පිහිටි ගල්වලහේන, මැණික්කුඹුර නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 2¼ ක පමණ ඉඩම් කොටස :—

උතුරට : කුරුවිට අප්පුහාමිගේ ඉඩම ;

නැගෙනහිරට : තලාහේන පාර ;

දකුණට : එඩ්වින්ට අයිති ඉඩම ;

බස්නාහිරට : තෝමිස් සිංඤෝට අයිති ඉඩම.

7-319—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

49 වැනි ඡේදය යටතේ සහතිකය

නිවාස සහ ගොඩනැගිලි ඇමති **පීටර් ජේරාල්ඩ් බර්තොලමියුස්** කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වැනි ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වැනි ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්පත් කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස සහ ගොඩනැගිලි ඇමති.

මහ4/අත්/194,
කොළඹදී ය,
1973 ජුනි 22.

### උපලේඛනය

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පරනකුරු කෝරළයේ මාකෑර ග්‍රාම සේවක කොටසේ පිහිටි මල්පැන්දෙනිය වත්තේ මහ හේන කොටස නමැති ඉඩමෙන් **පහත සඳහන් පරිදි මායිම්** කර ඇති ප්‍රමාණයෙන් අක්කර 3 ක් **පමණ වූ කොටස :**

උතුරට : පී. පී. සිරිවර්ධන මහතාගේ ඉඩම ;

නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස (මා හේන නොහොත් මල්පැන් දෙනිය වත්ත) ;

දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස (මා හේන නොහොත් මල්පැන්දෙනිය වත්ත) ;

බටහිරට : පී. පී. සිරිවර්ධන මහතාගේ ඉඩම.

7-344—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## සමගි මණ්ඩල පනත

ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1972 සැප්තැම්බර් මස 8 වැනි දින අංක 24 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 22 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි පුන්ගුඩුතිව් ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 1 හි පදිංචි තිල්ලෙයම්පලම් සතාසිවම් මහතා.

(2) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 1 හි පදිංචි සිට්ටම්පලම් අම්බිකයිපාගන් මහතා.

(3) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 1 හි පදිංචි තර්මලිංගම් පරරාජසිංහම් මහතා.

(4) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 1 හි පදිංචි තම්බයියා මහාලිංගසිවම් මහතා.

(5) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 2 හි පදිංචි යෝගම්මා සුබ්‍රමණියම් මිය.

(6) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 2 හි පදිංචි සුබ්‍රමණියම් ජෝසෙප් පූරාජා මහතා.

(7) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 2 හි පදිංචි මාරිමුත්තු කුමාරසාමි මහතා.

(8) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 3 හි පදිංචි සුබ්‍රමණියම් තිරුනාවුක්කරසු මහතා.

(9) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 3 හි පදිංචි අම්බලවානර් කනගසබයි මහතා.

(10) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 3 හි පදිංචි අරුලම්බලම් සුබ්‍රමණියම් මහතා.

(11) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 4 හි පදිංචි මුත්තයියා මයිල්වාගනම් මහතා.

(12) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 5 හි පදිංචි පොන්නයියා අරුමයිරත්නම් මහතා.

(13) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 5 හි පදිංචි කුරුමූර්ති ගණේෂමූර්ති මහතා.

(14) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 6 හි පදිංචි සෙල්ලයියා තර්මලිංගම් මහතා.

(15) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 6 හි පදිංචි පොන්නයියා කනගසබයි මහතා.

(16) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 8 හි පදිංචි විසුවලිංගම් රාජරත්නම් මහතා.

(17) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 9 හි පදිංචි ආරුමුගම් සුබ්‍රමණියම් මහතා.

(18) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 10 හි පදිංචි කුමාරවේලු රාජරත්නම් මහතා.

(19) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 10 හි පදිංචි කාර්තිගේසු මතියාපරනම් මහතා.

(20) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 11 හි පදිංචි සින්නතම්බි කණපතිපිල්ලෙයි මහතා.

(21) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 4 හි පදිංචි පෙරියතම්බි කාතිගේසු මහතා.

(22) පුන්ගුඩුතිව්. කොට්ඨාශ අංක 6 හි පදිංචි ඉලයතම්බි සුබ්‍රමණියම් මහතා.

(23) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 7 හි පදිංචි සෙල්ලප්පා සෝමසුන්දරම් මහතා.

(24) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 7 හි පදිංචි රාමලිංගම් කුලසේගරම්පිල්ලෙයි මහතා.

(25) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 7 හි පදිංචි කණපතිපිල්ලෙයි තියාගරාජා මහතා.

(26) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 8 හි පදිංචි කන්දයියා අයියාතුරෙයි මහතා.

(27) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 9 හි පදිංචි අම්බලවාණර් කුලන්තයිවේලු මහතා.

(28) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 10 හි පදිංචි වේලුපිල්ලෙයි සුප්පයියා මහතා.

(29) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 10 හි පදිංචි කන්දයියා වෛද්‍යනාතන් මහතා.

(30) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 12 හි පදිංචි සෝමසුන්දරම් සෝනාතිරාජා මහතා.

(ආ) පුන්ගුඩුතිව්, කොට්ඨාශ අංක 1 හි පදිංචි තිල්ලෙයම්පලම් සතාසිවම් මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවෙහි සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 ජූලි මස 03 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

7-504 --73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

## පරිවාස නිලධාරීන් පත්කිරීම

1956 සංශෝධිත ශ්‍රී ලංකා නීති සංග්‍රහයේ II වන කාණ්ඩය 24 වන පරිච්ඡේදයේ 18(3) වගන්තිය යටතේ වරදකරුවන් පරිවාස භාරයේ තබාගැනීම පිළිබඳ ආඥපනත අනුව, පහත උපලේඛනයේ දක්වෙන නිලධාරීන් ඉදිරියෙන් දක්වා ඇති පරිවාස ඒකකයන්හි එහි සඳහන් දිනයන්හි සිට පරිවාස නිලධාරීන් වශයෙන් පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එන්. කේ. ඒ. ද සිල්වා,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්.

1973 ජූනි මස 29 වැනි දින,
තැ. පෙ. 546, කොළඹ 1,
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.

උපලේඛනය

| | නම | | පරිවාස ඒකකය | | පත්කළ දිනය |
|---|---|---|---|---|---|
| 1. | ජේ. ඒ. ආර්. සැන්ඩර්ස් මහතා | | බලපිටිය | ... | 73.04.05 |
| 2. | එම්. ඒ. ගුණරත්න මහතා | ... | බම්බලපිටිය | ... | 73.04.05 |
| 3. | එන්. ඩී. එන්. චන්ද්‍රසිරි මහතා | | හම්බන්තොට | ... | 73.06.01 |
| 4. | සී. චක්‍රවර්ති මහතා | ... | හැටන් | ... | 73.06.05 |

7-283 —73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

**ස්වේච්ඡා පරිවාස නිලධාරිණිය—හම්බන්තොට අධිකරණ කොට්ඨාශය**

1968 ජූනි මස 21 වෙනි දින අංක 14,807 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීමෙන් පත්කරනු ලැබූ හම්බන්තොට අධිකරණ කොට්ඨාශයේ ස්වේච්ඡා පරිවාස නිලධාරිනී, ජී. එම්. බූල් මහත්මියගේ පත්වීම 1956 සංශෝධිත ලංකා නීති සංග්‍රහයේ II වන කාණ්ඩයේ 24 වෙනි පරිච්ඡේදයේ වරදකරුවන් පරිවාස භාරයේ තබාගැනීමේ ආඥාපනතේ 17 (2) වගන්තිය අනුව ගරු සමාජසේවා ඇමතිතුමා විසින් 1973.07.01 දින සිට අවලංගු කර ඇති බව මෙයින් දන්වමි.

එන්. කේ. ඒ. ද සිල්වා,
පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්.

1973 ජූනි මස 30 වෙනි දින,
කොළඹ 1, චැතැම් වීදියේ මෙල් ගොඩනැගිල්ලේ
අංක 103 1/1 පිහිටි පරිවාස හා ළමාරක්ෂක සේවා
දෙපාර්තමේන්තු මූලස්ථානයේ දී.

7–256—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**රජයේ නිලධරයන්ගේ යහසාධක සංගම් (නීතිගත කිරීමේ) පනත**

1971 වර්ෂයේ අංක 27 දරණ රජයේ නිලධරයන්ගේ යහසාධක සංගම් (නීතිගත කිරීමේ) පනතේ 4 වැනි වගන්තිය අනුව එම සංගමයේ කළමනාකාර කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් 1973 ජූනි 28 වැනි දින සිට දෑවුරුද්දක කාල පරිච්ඡේදයක් සඳහා ලංකා ගණකාධිකාරී සේවයේ ටී. සුන්දරරාජා මහතා, භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත්කරනු ලැබ සිටී.

සී. ඒ. කුරේ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1973 ජූනි මස 30 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

7-404—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ටී. 23/කො. 27/73.

**කාර්මික ආරවුල් පනත—131 වන පරිච්ඡේදය**

1957 අංක 14 හා 62, 1962 අංක 4 හා 1968 අංක 39 (1968, අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 1973 පෙබරවාරි මස 08 දින දරන නියෝගයෙන්, යොමුකරන ලදුව 1973 පෙබරවාරි මස 23 වැනි දින අංක 48 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද කේ. බී. සිල්වා මහතා, 211, "පත්මගිරි", මොරටුමුල්ල, මොරටුව සහ බෝනාර්ස් (සිලෝන්) ලිමිටඩ්, 15, මෝර්ගන් පාර, කොළඹ 2, අතර පැවතුනු කාර්මික ආරවුල පිළිබඳව බේරුම්කරු විසින් මා වෙත එවන්නට යෙදුන තීරණය, ඉහත සඳහන් කරන ලද පනතේ 18(1) වගන්ති යටතේ මෙයින් පළකරනු ලැබේ.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

1973 ජූනි මස 28 වැනි දින,
කොළඹ 5, කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

ටී. 23/කො. 27/73.

ඒ. 1215

කේ. බී. සිල්වා මහතා, 211, "පත්මගිරි", මොරටුමුල්ල, මොරටුව.

සහ

බෝනාර්ස් (සිලෝන්) ලිමිටඩ්, 15, මෝර්ගන් පාර, කොළඹ 2.

අතර පවතින කාර්මික ආරවුල

**තීරණය**

ගරු කම්කරු ඇමතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1958 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව මාවෙත යොමු කරන ලද්දකි.

දෙපක්ෂය අතර ආරාවුලට හේතුවී ඇත්තේ ඉහත සඳහන් පාර්ශ්වයන් අතර බෝනාස් සිලෝන් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් කේ. බී. සිල්වා මහතා සේවයෙහි නොයෙදවීම යුක්තිසහගත ද යන්නත් ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

ඉල්ලුම්කරු වන බර්ටි සිල්වා කියා සිටින්නේ ඔහු 1967.1.1 වෙනි දින සිට අනියම් සේවකයෙක් වශයෙන් බෝනාස් ආයතනයේ වැඩට යොදවන ලද බවය. 1967 අගෝස්තු මාසයේ සිට ස්ථිර සේවකයෙකු වශයෙන් පත්විය. ඔහුට එම කාලයේ මුල් පඩිය රුපියල් 240 ක් වූ බව කියයි. 1969 අගෝස්තු මස පටන් ඔහුව සේවයෙන් ඉවත් කොට ඊට පසුව සේවයට නොඑන ලෙස නියෝග කලේය මක් නිසාද යත් වෙන කෙනෙක් ඒ ආයතනය මිලයට ගෙන තිබෙන බැවිනි. බර්ටි සිල්වාගේ වැඩ නැවැත්වීම යුක්තිසහගත කරුණක් නොවේ. ඔහු විවාහකයෙකි. දරු තුන් දෙනෙකුද ඇත්තෙකි. එබැවින් දන් තාවකාලිකව කරන සේවයෙන් අස්වුවහොත් ඔහුට කරදර රාශියකට මුහුණ පෑමට තිබෙන බව නොඅනුමානය. ඔහුගේ සේවය අන්තිම කරන අවස්ථාවේදී රුපියල් 285 ක් වේතනය වශයෙන් ලැබුනේය. එබැවින් ආයතනය විසින් ඉල්ලුම්කරුට මෙසේ ගෙවිය යුතුය.

පාරිතෝෂික දීමනාවක් වශයෙන් රුපියල් 1,425 ක්ද. මාස 3 ක නොගෙවූ පඩිය රු. 855 ක්ද අවුරුදු 2 ක වන්දි වශයෙන් රු. 6,840 ක්ද වශයෙන් මුළු මුදල වූ රු. 9,120 ක් ඉල්ලුම්කරු වන බර්ටි සිල්වා මහතාට ගෙවන ලෙස වගඋත්තරකාර පක්ෂයට නියම කරමි.

මෙම මුදල අද පටන් මාස 4 ක් ඇතුළතදී සහකාර කම්කරු කොමසාරිස් (දකුණු කොළඹ) වෙත තැන්පත් කළ යුතුය.

මෙම තීරණය යුක්තිසහගත වූත්, සාධාරණ වූත් තීරණයක් බවට සහතික කරමින් ප්‍රදානය කරන ලද්දේ 1973 මාර්තු මස 30 වෙනි දින නාරාහේන්පිට පිහිටි කාර්මික අධිකරණයේදී ය.

නිව්ටන් එදිරිසිංහ,
බේරුම්කරු.

1973. 06. 21 වන දින,
කොළඹ දී ය.

7-291—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

එල්එන්/ඒ/182.
1972 දෙසැම්බර් 05 දින,

ඒ. සී. ජේ. ගුණවර්ධන මහතා,
56, පැපිලියාන පාර,
නැදිමාල,
දෙහිවල.

මහත්මයාණනි,

**කොග්ගල වෙරළේ ධීවර ආරවුල**

එක් අතකින් දීර්ඝ කාලයක් මුළුල්ලේ කොග්ගල පදිංචි කරුවන් යැයි කියා සිටින පුද්ගලයින් කණ්ඩායමක් සහ අනෙක් අතට මෑතකදී කොග්ගලට පැමිණ ජනපද වැසියන් ලෙසින් පදිංචිව සිටින හා දැනට සීමාසහිත ගාල්ල-හබරාදුව ධීවරයින්ගේ සමූපකාර සමිතියට ඒකාබද්ධ කර ඇති 'කොග්ගල කතළුව ධීවර සමූපකාර සමිතිය යනුවෙන් හැඳින්වෙන, ධීවර සමූපකාර සමිතියක් සංවිධානය කරගෙන සිටින පුද්ගලයින් කණ්ඩායමක් ද අතර කොග්ගල මුහුදු වෙරළට යාබද දේශීය මුහුදු තීරයේ, මෝදරහිල්ල තොටුපල, මරදවෙල තොටුපල, අන්දන තොටුපලෙහි ඉනි ආධාරයෙන් කරනු ලබන මසුන් ඇල්ලීම පිළිබඳව ඔවුනොවුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැන නැගී ඇති ධීවර ආරවුලක් ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කිරීම පිණිස ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 212 වැනි අධිකාරය වන ධීවර ආඥාපනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව ඔබ වෙත යොමු කරමි.

2. මෙම ආරවුලට විෂයව පවත්නා කාරණය මෙසේ යි :

(i) දීර්ඝ කාලයක් මුළුල්ලේ සිටම පදිංචි කරුවන් යයි කියා සිටින කණ්ඩායම, මෙම මුහුදු ඉනි ආධාරයන් කරනු ලබන මසුන් ඇල්ලීමේ තනි අයිතිය ඔවුන් සතු වන්නේ යැයි තරයේ ප්‍රකාශ කර සිටින අතර, අළුතින් පැමිණ සිටින්නන් විසින් දන්වන මසුන් ඇල්ලීමේ අයිතිවාසිකම් පිළිනොගනිති. තවද, ඔවුහු දෙවනුව සඳහන් අය විසින් කරනු ලබන මසුන් ඇල්ලීමේ කටයුතු කෙරෙහි විරෝධය දක්වති.

(ii) මෙහි මුහුදු තීරයේ ඉනි ආධාරයෙන් කරනු ලබන මසුන් ඇල්ලීම පිළිබඳව තහවුරුව පවත්නා, අයිතියක් ඔවුන් සතු වන්නේ යැයි ද, ඔවුන්ගේ ජීවනෝපාය සඳහා ඔවුන් විසින් කරනු ලබන මසුන් මැරීමේ කාර්යයන්හි යෙදීම අත්‍යාවශ්‍ය බවද, නව පදිංචි කරුවෝ ප්‍රකාශ කර සිටිති.

3. මෙම ආරවුලට විෂයව පවත්නා කාරණය පිළිබඳව පමණක් නොව, මෙම වගන්තියේ විධිවිධාන වලට අනුකූලව ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබියහැකි නියෝජන වල සඳහන් වන්නාවූ, මෙම ආරවුලට අදාලවූත්, සම්බන්ධවූත්, එයින් පැන නගින්නාවූත් සියළුම කරුණු පිළිබඳව ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කරන්නේ නම් සතුටු වෙමි.

මෙයට,
ඔබගේ කීකරු සේවක,

ජෝර්ජ් රාජපක්ෂ,
ධීවර ඇමති.

7-459/1 —73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**(212 වෙනි අධිකාරය වන) ධීවර ආඥාපනතේ 20 (3) වෙනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි**

**කොග්ගල ධීවර ආරවුල**

එක් අතකින් දීර්ඝ කාලයක් මුළුල්ලේ කොග්ගල පදිංචිකරුවන් යැයි කියා සිටින පුද්ගලයින් කණ්ඩායමක් සහ අනෙක් අතට මෑතකදී කොග්ගලට පැමිණි ජනපදවැසියන් ලෙසින් පදිංචිව සිටින හා දැනට සීමාසහිත ගාල්ල-හබරාදුව ධීවරයින්ගේ සමුපකාර සමිතියට ඒකාබද්ධ කරනු ලැබ ඇති "කොග්ගල කතළුව ධීවර සමුපකාර සමිතිය" යනුවෙන් හැඳින්වෙන, ධීවර සමුපකාර සමිතියක් සංවිධානය කරගෙන සිටින පුද්ගලයින් කණ්ඩායමක් ද අතර කොග්ගල මුහුදු වෙරළට යාබද දේශීය මුහුදු තීරයේ, මෝදරහිල්ල තොටුපල, මරඳවෙල තොටුපල සහ අන්දන තොටුපලෙහි ඉනි සිටුවා ඒ මත සිට කරනු ලබන මසුන් ඇල්ලීම පිළිබඳව ඔවුනොවුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැන නැගී ඇති ධීවර ආරාවුලක්, ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කිරීම සඳහා ධීවර ඇමතිතුමා විසින් (212 වැනි අධිකාරය වන) ධීවර ආඥාපනතේ 20 (1) වැනි වගන්තිය ප්‍රකාරව මා වෙත යොමුකර ඇත.

2. ආරාවුලට විෂයව පවත්නා ප්‍රධාන කාරණය පහත දැක්වේ :—

(i) දීර්ඝ කාලයක් මුළුල්ලේ සිටම පදිංචිකරුවන් යැයි කියා සිටින කණ්ඩායම, මෙහි මුහුදු තීරයේ සිටුවනු ලබන ඉනි මත සිට මසුන් ඇල්ලීමේ තනි අයිතිය ඔවුන් සතුවන්නේ යැයි තරයේ ප්‍රකාශ කර සිටින අතර, අළුතින් පැමිණ සිටින්නන් විසින් දක්වන මසුන් ඇල්ලීමේ අයිතිවාසිකම් පිළිනොගනිති. තවද ඔවුහු දෙවනුව සඳහන් අය විසින් මසුන් ඇල්ලීම කරගෙන යාම ගැන විරෝධය දක්වති.

(ii) මෙහි මුහුදු තීරයේ සිටවනු ලබන ඉනි මත සිට මසුන් ඇල්ලීමට තහවුරුව පවත්නා අයිතියක් ඔවුන් සතුව ඇතැයි ද, ඔවුන්ගේ ජීවනෝපාය සඳහා මෙසේ මසුන් ඇල්ලීමේ කාර්යයන්හි යෙදීම අත්‍යාවශ්‍ය බවද නව පදිංචිකරුවෝ ප්‍රකාශ කර සිටිති.

3. මෙම ආරාවුලට විෂයව පවත්නා කාරණය පිළිබඳව මෙන්ම මෙම ආරාවුලට අදාලවූත්, සම්බන්ධවූත්, නැතහොත් එයින් පැන නගින්නාවූත් සියළුම කරුණු පිළිබඳව ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කරන මෙන් මගෙන් ඉල්ලා ඇත.

4. මෙම ආරාවුල පිළිබඳව හෝ එයට අදාලවූත්, සම්බන්ධවූත් නැතහොත් එයින් පැන නගින්නාවූත් වෙනත් කරුණු පිළිබඳව හෝ ලිඛිත කරුණු සැලකිරීම් ඉදිරිපත් කිරීමට කැමති මෙම ආරාවුලට සම්බන්ධ වූ හෝ ඒ පිළිබඳව උනන්දුවක් දක්වන්නා වූ හෝ සියලුම පුද්ගලයිනට, තම තමන්ගේ ලිඛිත කරුණු සැලකිරීම් 1973. 08. 14 දිනට හෝ ඊට පෙර හෝ කොළඹ 3, ගාළු මුවදොර තැ. පෙ. 531, නීති සම්පාදන ශාඛාව, ධීවර අධ්‍යක්ෂගේ කාර්යාලයට ලැබෙන සේ විභාගයට කැඳවීමට කැමති සාක්ෂිකරුවන් කිසිවකු සිටී නම් ඔවුන්ගේ නම්ද සඳහන් කරමින් ලියාපදිංචි කළ තැපෑලෙන් එවන මෙන් ආරාධනය කරමි. මෙම දිනයට පසුව ලැබෙන කරුණු සැලකිරීම් ගැන සළකා බලනු නොලැබේ.

5. මෙම ආරාවුලට විෂයව පවත්නා කාරණය පිළිබඳව හෝ එයට අදාලවූ හෝ සම්බන්ධවූ හෝ නැතහොත් එයින් පැන නගින්නාවූ හෝ ඕනෑම කාරණයක් පිළිබඳව හෝ ප්‍රසිද්ධ විභාගයක් මා විසින් 1973 අගෝස්තු මස 17 දින පෙ. ව. 9 ට වැලිගම ධීවර කාර්යාලයේදී ආරම්භ කරනු ලැබේ.

මෙම ආරාවුලට විෂයව පවත්වා කාරණයෙන් හෝ මෙම ආරාවුලට අදාලවූ, සම්බන්ධවූ හෝ එයින් පැන නගින්නාවූ හෝ ඕනෑම කාරණයකින් හිරිහැරයට පත් ඕනෑම අයෙකුට පුද්ගලිකව හෝ නියෝජිතයෙකු මගින් හෝ නීතිඥයකු මගින් හෝ ආයාචකයෙකු මගින් හෝ මෙම විභාගයට පෙනී සිට ඉදිරිපත් කර ඇති කරුණු සැලකිරීම් සනාථකිරීම සඳහා ලිඛිත හෝ වාචික හෝ සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩ ලැබෙන්නේ ය.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන.

1973. 07. 02 දින,
කොළඹ දී ය.

7-459/2 – 73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය**

කෑගල්ල-බුලත්කොහුපිටිය පාරේ අංක 11/8 දරණ පාලමේ නැවත තට්ටුව දැමීම

කෑගල්ල-ගලිගමුව කොට්ඨාශය—සබරගමුව දිසාව

ඉහත දක්වා ඇති පාලමේ නැවත තට්ටුව දැමීමේ වැඩ නිමවන තුරු එය 1973.07.25 වැනි දින සිට මාසයක කාලයක් තුල සියළු රථ වාහන සඳහා වසා තබනු ලබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම කාලය තුල කබගමුව-කනන්ගමුව-මොරදන පාර අතුරු පාරක් වශයෙන් පාවිච්චි කළ හැකිය.

එස්. සෙල්වදුරෙයි,
දිසා වැඩ අධ්‍යක්ෂ,
සබරගමුව.

දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
සබරගමුව, රත්නපුරය,
1973.06.29.

7-312 —73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**වන්දනා ගමන් ආඥාපනත**

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සේරුවිල උත්සවය—1973

ඉහත සඳහන් උත්සවය 1973 අගෝස්තු 06 දින පටන් ගෙන 1973 අගෝස්තු 14 දින දක්වා පවත්වනු ලබන බව එකී උත්සව සඳහා පැමිණෙන අයගේ සහ අනිකුත් සියලු දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1967 අගෝස්තු 12 වැනි දින අංක 14,761/1 දරණ ලංකාණ්ඩුවේ ගැසට් නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සවය සමයේදී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේත් අනිකුත් අයගේත් අවධානය මෙයින් යොමු කරවමි.

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

1973. 07. 02 වන දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේදීය.

7-426—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

අංක 444

**1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ඒකාබද්ධ වන සමිති'' යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ප්‍රධාන සමිතිය '' යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමඟ 1973.07.22 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්.

1973.07.05 වැනි දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී ය.

**පළමුවැනි උපලේඛනය**

**ඒකාබද්ධ වන සමිති :**

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි. ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත අරිප්පු පාතිමා ධීවර කාර්මිකයින්ගේ නිපදවීමේ සහ අලෙවිකිරීමේ සමුපකාර සමිතිය... | ... එම්. එන්. 50 | ... 1959.06.17 |
| 2. | සීමාසහිත මුල්ලිකුලම් ධීවර කාර්මිකයින්ගේ නිපදවීමේ සහ අලෙවිකිරීමේ සමුපකාර සමිතිය | ... එම්. එන්. 57 | ... 1959.11.10 |

**දෙවෙනි උපලේඛනය**

ප්‍රධාන සමිතිය

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත මුසලි කොට්ඨාශයේ ධීවර කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය ... ... ... | මන්. 139 | ... 1972.04.03 |

7-454/1—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

අංක 443

**1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

**2 (1) වැනි වගන්තිය යටතේ ආඥාව**

1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 2 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්, රාජගුරු බණ්ඩාර රාජගුරු වන මම, මෙහි වූ පළමුවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ඒකාබද්ධ වන සමිති '' යනුවෙන් හැඳින්වෙන) සමිති මෙහි වූ දෙවැනි උපලේඛනයෙහි නිශ්චය කොට දක්වා ඇති ('' ප්‍රධාන සමිතිය '' යනුවෙන් හැඳින්වෙන) සමිතිය සමඟ 1973.07.22 වැනි දින සිට ක්‍රියාත්මක වන සේ මෙම ආඥාවෙන් ඒකාබද්ධ කරමි.

රා. බ. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ත්‍රාර්.

1973.07.05 වැනි දින,
කොළඹ 1,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී ය.

**පළමුවැනි උපලේඛනය**

**ඒකාබද්ධ වන සමිති :**

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි. ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත කලුවන්කර්නි ආදවන් ධීවර සමුපකාර සමිතිය ... ... ... | බී.සී. 99 | ... 1964.04.29 |
| 2. | සීමාසහිත පුන්නෙයිකුඩා ධීවර කාර්මිකයින්ගේ ණය හා අලෙවිකිරීමේ සමුපකාර සමිතිය ... ... | මඩ. 135 | ... 1971.05.31 |

**දෙවෙනි උපලේඛනය**

ප්‍රධාන සමිතිය

| | සමිතියේ නම | ලි.ප. අංකය | ලි.ප. කළ දිනය |
|---|---|---|---|
| 1. | සීමාසහිත එරාවුර්පත්තු ධීවර කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය ... ... ... | මඩ 141 | ... 1972.02.17 |

7-454/2—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**මත්ද්‍රව්‍ය ගමන් ආඥාපනත**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිරියාය උත්සවය—1973

යථෝක්ත උත්සවය 1973 අගෝස්තු 11 වෙනි දින පටන් 1973 අගෝස්තු 13 වෙනි දින දක්වා පවත්වනු ලබන බව එකී උත්සවය සඳහා පැමිණෙන අයගේ සහ අනිකුත් සියළු දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1967 අගෝස්තු 12 වෙනි දින අංක 14,761/1 දරණ ලංකාණ්ඩුවේ ගැසට් නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සවය සමයේදී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේත් අනිකුත් අයගේත් අවධානය මෙයින් යොමු කරවමි.

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිසත්‍රික්කයේ දිසාපති.

1973. 07. 02 වන දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේදීය.

7-428—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1971 අගෝස්තු මස 1 වැනි දින සිට ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි තෝප්පූර් ග්‍රාමසේවක කොට්ඨාශය, තෝප්පූර් සහ අල්ලේනගර් යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ දෙකකට බෙද ඇති බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. 1971 අගෝස්තු 20 වැනි දින හා අංකය 14,972 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම මෙයින් අවලංගු කෙරේ.

(අ) පහත සඳහන් ගම්, අංක 216 දරණ තෝප්පූර් ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

| | | |
|---|---|---|
| (1) තෝප්පූර් | (3) පාලතෝප්පූර් | (5) කිලිවෙඩ්ඩි |
| (2) කල්ලම්පත්තෙයි | (4) කුර්කන්ඩම් | (6) භාරතීපුරය (ව.ඉ. 4) |

(ආ) පහත සඳහන් ගම් අංක 216ඒ දරණ අල්ලේනගර් ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

| | | |
|---|---|---|
| (1) අල්ලේනගර් | (2) නාවට්කේනිවේනයි | (3) ආරෛපත්තෙයිවේනයි |

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත් මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනය සහ මැතිවරණ දිස්ත්‍රික්කය සෑම දෙනාගේම දැනගැනීම සඳහා පහත දක්වනු ලැබේ :—

| ග්‍රාමසේවක කොට්ඨාශ අංක | මහේස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | උප්පැන්න, මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලන ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය | පොලිස් වසම |
|---|---|---|---|---|---|---|
| (1) තෝප්පූර්—අංක 216 | ත්‍රිකුණාමලය ... | තෝප්පූර් ... | තෝප්පූර් ... | තෝප්පූර් ගම්සභාව | මුතූර් ... | මුතූර් |
| (2) අල්ලේනගර්—අංක 216ඒ | එම ... | එම ... | එම ... | එම ... | එම ... | එම |

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිසාපති.

1973 ජූනි මස 07 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කායර්‍යාලයේ දීය.

7-456/1—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### වැරදි නිවැරදි කිරීම

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුවිල ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙහි ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

ඉහත සඳහන් කරුණ ගැන, අංක 14,971 හා 1971 අගෝස්තු මස 13 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ, I වැනි කොටසේ I වැනි ඡෙදයේ පල කරන ලද නිවේදනයේ 1(අ) ඡෙදය පහත දක්වෙන පරිදි සංශෝධනය කර තිබෙන බව මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම්, අංක 215 දරණ සේරුවිල ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

| | | |
|---|---|---|
| (1) සේරුවිල | (4) සීනන්වේලි | (7) මහින්දපුර ජනපදය |
| (2) මංගලවැව තරුණ ව්‍යාපාරය | (5) අල්ලෙයි දකුණු ඉවුර ජනපදය | (8) සෙල්වනගර් |
| (3) උප්පුරල් | (6) බ්ලොක් සී ජනපදය | |

තිස්ස දේවේන්ද්‍ර,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජූනි මස 07 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කායර්‍යාලයේ දීය.

7-456/2—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

### සමන්තුරපත්තුවේ ගවයින් හංවඩු ගැසීමේ දිනයන් සහ ස්ථානයන්—1973

| ග්‍රා. සේ. අංකය | ග්‍රාම සේවක කොට්ඨාශය | හංවඩුගැසීමේ ස්ථානය | හංවඩු ගැසීමේ දිනය |
|---|---|---|---|
| 77 ... | සමන්තුර ද්‍රවිඩ කොට්ඨාශය ... | ග්‍රාම සේවක කායර්‍යාලය ... ... | ... 73.07.16, 73. 7.17 |
| | | ආලිමුඩ කාලයියඩි ... ... | ... 73.07.18, 73.07.19 |
| | | සදක්කර් කාලෙයි ... ... | ... 73.07.20, 73.07.21 |
| | | කොල්ලන්ඩ අරසඩි ... ... | ... 73.07.23, 73.07.24, 73.07.26 |
| 78 ... | සමන්තුර කොට්ඨාශ අංක 1 ... | ග්‍රාම සේවක කායර්‍යාලය ... ... | ... 73.07.16, 73.07.17, |
| | | සදක්කර් කාලෙයි ... ... | ... 73.07.18, 73.07.19 |
| 78ඒ ... | සමන්තුර කොට්ඨාශ අංක 2 ... | ග්‍රාම සේවක කායර්‍යාලය ... ... | ... 73.07.16, 73.07.17, 73.07.18 |
| 79 ... | සමන්තුර බ්ලොක් ජේ. නැගෙනහිර | මන්ජකේනි වට්ටෙයි ... ... | ... 73.07.16, 73.07.17 |
| | | පාලාවඩි වට්ටෙයි ... ... | ... 73.07.18, 73.07.19 |
| 79ඒ ... | සමන්තුබ්ලොක් ජේ බටහිර ... | අසරප්පා වට්ටෙයි ... ... | ... 73.07.16 |
| | | පනිච්චන්කේනි වට්ටෙයි ... ... | ... 73.07.17, 73.07.18, 73.07.19 |
| 80 ... | සමන්තුර කොට්ඨාශ අංක 3 ... | සෙවගපත්තු ආලිමුඩකා ලෙයියඩි ... | ... 73.07.16, 73.07.17, 73.07.18 |
| | | ග්‍රාම සේවක කායර්‍යාලය ... ... | ... 73.07.19, 73.07.20, 73.07.21 |
| 81 ... | සමන්තුර කොට්ඨාශ අංක 4 ... | සෙවුගපත්තුවට්ටෙයි ... ... | ... 73.07.18, 73.07.19 |
| | | ග්‍රාම සේවක කායර්‍යාලය ... ... | ... 73.07.20, 73.07.21 |
| 82 ... | මල්කම්පිඩි ... ... | මාවඩිනිඩල් මල්කම්පිඩි ... ... | ... 73.07.16, 73.07.17 |
| | | පට්ටම්පිඩිමා වඩිනිඩල් ... ... | ... 73.07.18, 73.07.19 |
| 84 ... | ඉරක්කාමම් ... ... | කට්ටුවාල් ... ... | ... 73.07.23, 73.07.24 |
| | | මුනෙයිපල්ලම් ... ... | ... 73.07.27, 73.07.28 |
| | | මුතලියාර් වට්ටෙයි ... ... | ... 73.07.30, 73.07.31 |
| 85 ... | වරිපතන්චේනෙයි ... | අච්චිමොහමදු කාලෙයඩි ... ... | ... 73.07.16, 73.07.17 |
| | | මුතලියාර් වට්ටෙයි ඉස්මා ලෙබ්බෙ කාලෙයඩි | ... 73.07.18, 73.07.19 |
| | | ග්‍රාම සේවක කායර්‍යාලය ... ... | ... 73.07.20 |

| ග්‍රා.සේ. අංකය | ග්‍රාම සේවක කොට්ඨාශය | හංවඩු ගැසීමේ ස්ථානය | හංවඩු ගැසීමේ දිනය |
|---|---|---|---|
| 89 | මල්වත්තෙයි | ග්‍රාම සේවක කායසීාලය | 73.07.16, 73.07.17 |
| | | මල්ලිකෙයිතිවු උඩයාර් වලවු | 73.07.18, 73.07.19 |
| | | වලතා පිඩිපාලයඩි වලවු | 73.07.20, 73.07.21 |
| | | මජීද්පුරම් ග්‍රාම සංවර්ධන සමිති වලවු | 73.07.23, 73.07.24 |
| 90 | සොරිකල්මුනෝ | ග්‍රාම සේවක කායසීාලය | 73.07.16, 73.07.17 |
| | | ජනපද අංක 6 දුම්කොළ ගොවිපල | 73.07.18, 73.07.19 |
| | | වීරවෝලේ රජයේ පාසැල අසල | 73.07.20, 73.07.21 |
| 92 | වීරමුනෝ | කො. අංක 1 අරසමරත්තඩි | 73.07.17, 73.07.18 |
| | | කො. අංක 1 එම්. අබ්දුල් කාදර් වලවු | 73.07.19 |
| | | සෙම්මන් වට්ටෙයි ගම් සහා ප්‍රදේශය | 73.07.20, 73.07.21 |
| 93 | චවලකඩේ | ජනපද අංක 4 වේපිපඩිතෝට්ටම් | 73.07.16, 73.07.17 |
| | | ජනපද අංක 5 වීරත්තිඩල් | 73.07.18, 73.07.19 |
| | | චවලකඩේ මාරගස්හන්දිය | 73.07.20, 73.07.21 |
| 94 | නාවිතන්වෙලි | ග්‍රාම සේවක කායසීාලය | 73,07.16, 73.07.17 |
| | | නාවිදන්වෙලි ගම්සභා කායසීාලය | 73.07.18, 73.07.19 |
| | | ජනපද අංක 15 සමුපකාර සමිති වලව්ව | 73.07.20, 73.07.21 |
| | | ජනපද අංක 12 සමුපකාර සමිති වලව්ව | 73.07.23, 73.07.24 |
| | | ජනපද අංක 11/11 වලව්ව | 73.07.26, 73.07.27 |
| 95 | අන්නමලේ | අන්නමලෙයි කේ. සින්නදුරේ වලව්ව | 73.07.30, 73.07.31 |
| | | කුඩියිරුප්පුමුනෝ එස්. සාමි තම්බිගේ වලව්ව | 73.08.01, 73.08.02 |
| | | ජනපද වෙම්බඩි | 73.08.03, 73.08.04 |
| | | ජනපද අංක 13 රජයේ පාසැල අසල | 73.08.06, 73.08.07 |

ඩී. විජේසිංහ,
අම්පාර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1973.06.30.
දිසාපති කාර්යාලය,
අම්පාර.

7–398—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

---

**හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ ගවයින් නිවරණය කිරීම—1973 වර්ෂය**

1962.08.20 වෙනි දින අංක 13,268 සහ 1962.11.29 දින අංක 13,406 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රවල ප්‍රසිද්ධ කරනු ලැබූ 1953 අංක 29 දරණ සත්ව පනතේ 35 වෙනි වගන්තිය ප්‍රකාර පනවන ලද 12(iii) වෙනි රෙගුලාසි අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ ගවයින් නිවරණය කිරීම පහත දක්වෙන උපලේඛණයේ සඳහන් දිනවල සහ ස්ථානවලදී සිදු කරනු ලබන බැව් මහජනයා වෙත මෙයින් දන්වනු ලැබේ.

ඩී. එච්. ජේ. අබේගුණසේකර,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 ජූනි මස 29 වෙනි දින,
හම්බන්තොට කච්චේරියේ දීය.

උපලේඛනය

| ග්‍රා. සේ. අංකය | ග්‍රාම සේවක කොට්ඨාශය | නිවරණය කරන ස්ථානය | නිවරණය කරන දිනය |
|---|---|---|---|
| 536 | උඩයාල | මැදයාල පිහිටි බැබිලදෙණිය වත්ත | 1973.08.10 |
| | | බෝගමුව පිහිටි පොල්මණ්ඩිය වත්ත | 1973.08.11 |
| | | පහත ගිරුවල පිහිටි වැවේ වත්ත | 1973.08.12 |
| 537 | හකුරුවෙල | හකුරුවෙල හන්දිය අසල | 1973.08.10 |
| | | නෙටොල් පෝරුවේ හන්දිය අසල | 1973.08.11 |
| 538 | දහඅමුන | ග්‍රාම සේවක කාර්යාලය | 1973.08.21 |
| | | කොටවාය හන්දිය අසල | 1973.08.22 |
| | | තලම්පෝරුව සමුපකාරය අසල | 1973.08.23 |
| | | දෙපැලමුල්ල බෝගහ ලඟ | 1973.08.24 |
| | | නිහිලුවේ අප්පුහාමිගේ කඩේ | 1973.08.25 |
| 539 | ජුලමුල්ල | ජුලමුල්ල රොඩ්වාඩියේ සියඹලා ගහ ලඟ | 1973.08.07 |
| | | ජඳුර සිට සියඹලාගස් වැවට යන පාර අසල | 1973.08.08 |
| | | හැලේකඩ ගල් කොරිය අසල | 1973.08.09 |
| | | හැලේකඩ සුසාන භූමිය අසල | 1973.08.10 |
| | | කරගහවල පාලු ලිඳ අසල | 1973.08.12 |
| | | ජඳුරට යන පාර ලඟ හන්දිය අසල | 1973.08.15 |
| | | පලුගහවල සියඹලා ගහ අසල | 1973.08.16 |
| | | දන්දෙනිගම තේ කඩේ අසල | 1973.08.17 |
| | | තෙරුන්ගම තේ කඩේ අසල | 1973.08.19 |
| 540 | වකමුල්ල | අත්තනයාල සමුපකාරය අසල | 1973.08.22 |
| | | හීන්ආරේ පාසල අසල | 1973.08.23 |
| 541 | මැදගොඩ | ග්‍රාම සේවක කාර්යාලය | 1973.07.15 |
| | | දිඹුල්ගොඩ අක්කර හයේ කඩේ ලඟ | 1973.07.17 |
| | | දිනුවන්ගොඩ කන්ඩු මහතාගේ කඩේ | 1973.08.18 |
| 542 | හීන්බුන්න | ගජනායකගම හන්දිය අසල | 1973.08.04 |
| 542 | හීන්බුන්න | මතුලාදෙනිය ගටමාන්නේ ගෙදර | 1973.08.05 |
| | | කඩේ ලඟ වත්ත අසල | 1973.08.06 |
| | | හීන්ආරේ නිකුලස් මහතාගේ වත්ත | 1973.08.07 |

| ග්‍රා. සේ. අංකය | ග්‍රාම සේවක කොට්ඨාශය | නිවරණය කරන ස්ථානය | නිවරණය කරන දිනය |
|---|---|---|---|
| 553 | වැලිපටන්විල | මොදරගොඩ පටබැඳිරාලහාමිගේ කඩේ අසල | 1973.08.08 |
| | | නෝනගම හන්දිය අසල | 1973.08.09 |
| | | ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.10 |
| 554 | තවාලුවිල | ග්‍රාම සේවක කාර්යාලය | 1973.07.02 |
| | | මල්පෙත්තාව සමුපකාර මන්දිරය අසල | 1973.07.03, 04 |
| | | පුහුල්යාය බස්නාව අසල | 1973.07.05, 06 |
| | | බෙලිගාලගොඩ හන්දිය | 1973.07.07 |
| | | පලුගහ ගොඩැල්ල සී 3 ඇල ළඟ | 1973.07.08 |
| 555 | ලූනම | කිවුලේ පාසල හන්දිය | 1973.08.01 |
| | | ලූනම විවිධ සේවක සමුපකාර සමිතිය අසල | 1973.08.03 |
| 556 | බැමිණියන්විල... | ග්‍රාම සේවක කාර්යාලය | 1973.07.29 |
| | | වලවෙ වත්ත වෙදමහත්මයාගේ කඩේ | 1973.07.30 |
| | | රොටවල සමුපකාරය අසල | 1973.07.31 |
| | | අන්දරවීරගේ නිවස අසල | 1973.08.01 |
| | | නුගසෙවන ... | 1973.08.02 |
| 557 | ඇත්බටුව | ඇත්බටුව වැව අසල | 1973.08.14 |
| | | පල්ලරොටේ ගහගාව වත්ත | 1973.08.16 |
| 559 | මිණිඇතිලිය | පිට්ටනියාය වැව අසල | 1973.07.09 |
| | | අලුත්ගම මැන්ඩිස් සිල්වාගේ නිවස අසල | 1973.07.10 |
| | | පලපොත කලුමහත්මයාගේ ඉඩම | 1973.07.11 |
| | | දෙනිය හන්දිය අසල | 1973.07.12 |
| | | මිණිඇතිලියගොඩ කරෝලිස්ගේ නිවස අසල | 1973.07.13 |
| | | මැදරොදේගොඩ නුගේවත්ත විදානමහතාගේ ඉඩම | 1973.07.15 |
| 561 | පල්ලෙගම | පට්ටවලුව ගම්සභා ලිඳ ළඟ | 1973.08.04 |
| | | කිරිබත් ආර වෙල අසල | 1973.08.05 |
| | | මැද එලිය වැව අසල | 1973.08.06 |
| | | පල්ලෙගම හුංගම වැව අසල | 1973.07.07 |
| | | තුඩුව කලපුව අසල | 1973.08.08 |
| 562 | බටඅත | බටඅත ග්‍රාම සේවක කාර්යාලය අසල | 1973.08.15 |
| 563 | හාතාගල | පන්සල හන්දිය | 1973.07.16 |
| | | විවේකාරාම හන්දිය | 1973.07.17 |
| | | ගල්මුල්ල පිට්ටනිය | 1973.07.18 |
| | | කලමැටිය ඩබ්ලිව්. ජී. පීටර්ගේ නිවස අසල | 1973.07.19 |
| 564 | අගුණකොලපැලැස්ස | අ. ග. සි. 438 සුසාන භූමිය ඉඩම | 1973.08.24 |
| | | අ. ග. සි. 452 යකාගල ගම් සභා ලිඳ අසල | 1973.08.26 |
| | | අ. ග. සි. 436 කුඩාවැව ගිල්ම රජය සතු ඉඩම... | 1973.08.28 |
| | | අ. ග. සි. 440 මූලනගොඩ රජය සතු ඉඩම | 1973.08.30 |
| 567 | මූලන | ග්‍රාම සේවක කාර්යාලය | 1973.08.26 |
| | | දික්වැව අසල | 1973.08.27 |
| | | මහවෙල පාසැල අසල | 1973.08.28 |
| | | ගෝපැලැස්ස ආවාසය අසල | 1973.08.29 |
| | | උඩරොටේ පන්සල අසල | 1973.08.30 |
| | | හඳුන්කටුව වැව අසල | 1973.08.31 |
| 568 | මාමඩල | ග්‍රාම සේවක කාර්යාලය | 1973.08.10 |
| | | වලවේ වත්ත හැරෙන හන්දිය | 1973.08.11 |
| | | ජන්සගම අක්කර අටේ කඩේ | 1973.08.12 |
| | | හැඩවින්න හන්දිය අසල | 1973.08.13 |
| 671 | තලාව | ග්‍රාම සේවක කාර්යාලය | 1973.08.07 |
| | | කාරියමඩිත්ත ගොඩේ කඩේ | 1973.08.08 |
| | | මාර්කට් එක අසල | 1973.08.09 |
| 579 | සියඹලාකොටේ | වැටිය උඩහගෙදරදී | 1973.07.16 |
| | | බරවකුඹුක මහජන පොල අසල | 1973.07.17 |
| | | ගැමුණුපුර සමුපකාරය අසල | 1973.07.18 |
| | | සියඹලාකටුව පහල වැව අසල | 1973.07.19 |
| 580 | දබරැල්ල | කැන්ද කැටිය ආර්. ඒ. අන්දිරිස්හාමිගේ ගෙදර | 1973.08.21 |
| | | දබරැල්ල එල්. කේ. ජී. දියෝනිස්ගේ ගෙදර | 1973.08.22, 23 |
| | | කිවුල තඹලපැලැස්ස කේ. ඒ. මුදලිහාමිගේ ගෙදර | 1973.08.26 |
| | | රත්මලවල හා කච්චිගල වී. පී. සියදෝරිස්ගේ ගෙදර | 1973.08.28 |
| 581 | අබේසේකරගම | සියඹලාකොරටුව ඩී. ජේ. අබේසේකර මහතාගේ ගෙදර | 1973.07.15 |
| | | උස්වැව එම්. ඩී. දෙන් අන්දරයස්ගේ ඉඩම | 1973.07.16 |
| | | එම්. ඒ. චාර්ලිස්ගේ බෝගහ ගාව වත්ත | 1973.07.17 |
| 582 | උස්වැව | උස්වැව තැපැල් කාර්යාලය අසල | 1973.08.02 |
| | | අමරතුංගම හන්දිය අසල | 1973.08.06 |
| 583 | දෙමබොක්කාව | ග්‍රාම සේවක කාර්යාලය | 1973.07.20 |
| | | සූරියපොකුණ පන්සල අසල | 1973.07.21 |
| 585 | වාදුරුප්ප | ග්‍රාම සේවක කාර්යාලය | 1973.08.12 |
| | | වාදුරුප්ප රෝහල අසල | 1973.08.19 |
| 585ඒ | බෝලාන | ග්‍රාම සේවක කාර්යාලය | 1973.08.14 |
| | | බෝලාන පාසැල අසල | 1973.08.15 |
| | | කරගස්ආර හන්දිය | 1973.08.16 |
| | | බෝගහ හන්දිය | 1973.08.17 |
| | | මැලේ කොළණිය සමුපකාරය අසල | 1973.08.18 |
| 589 | කොග්ගල්ල | ග්‍රාම සේවක කාර්යාලය | 1973.07.21 |
| | | කොග්ගල්ල රජයේ පාසල අසල | 1973.07.22 |

7-397—73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ 1972–73 වර්ෂයේ ගවයින් හණ නිවරණය කිරීමේ වැඩ සටහන

1972 නොවැම්බර් මස 29 වැනි දින අංක 13,406 (සිංහල) දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හණ නිවරණය කිරීම පිළිබඳ නිති මාලාවේ 12 (III) වගන්තිය අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශිය උප දිසාපති කොට්ඨාශයේ 1972–73 වර්ෂයේ ගවයින් නිවරණය කිරීමේ වැඩ සටහන මහජනයාගේ දැන ගැනීම පිණිස මෙහි පහත ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඛ. සු. විජේවීර,
පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ දිසාපති.

1973.07.02 වැනි දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දිය.

ගවයින් නිවරණ කිරීම—1972–1973—හලාවත පා: උ : දි : කොට්ඨාශය

| කොට්ඨාශය | වසම | ස්ථානය | දිනය |
|---|---|---|---|
| 533 | උරලියාගාර | ග්‍රාම සේවක කාර්යාලය ග්‍රාම අභ්‍යාස මධ්‍යස්ථානය සහ මාදම්පේ පොලිස් ස්ථානය | |
| 543 | කුඩිරිප්පුව | ග්‍රාම සේවක කාර්යාලය පොනුවිල, අමරසිංහ මහතාට අයිති ගුරුවත්ත | |
| 550 | කරව්ටාගාර | ග්‍රාම සේවක කාර්යාලය කරව්ටාගාර මන්සන්දිය අසල සහ කරව්ටාගාර ග්‍රාම සංවර්ධන සමිති ශාලාව පිහිටි ඉඩම | |
| 556 | වාලහේන | ග්‍රාම සේවක කාර්යාලය පිටර් ගුණසේකර මහතාට අයිති දෙල්ගහ වත්ත සහ මනක්කුලමේ ලුවිස් සිංඤෝ මහතාට අයිති විහේනවත්ත | සැම මසකම සඳුද දින |
| 563 | ඔලිඳළුව | ග්‍රාම සේවක කාර්යාලය | |
| 570 | මහවිලත්තව | ග්‍රාම සේවක කාර්යාලය විරපඩියාන, කිරියා මහතා පදිංචි ඉඩම සිප්පිකලාන මැණිකා විදනේ පදිංචි ඉඩම, කහවත්ත මාලිගා වත්ත සහ කනත්තව කන්දෙවත්ත | |
| 535 | පට්ටියගම | එගොඩයාගම මාදමන්ගහවත්ත | |
| 544 | ගල්මුරුව | ග්‍රාමසේවක කාර්යාලය කච්චකඩුව බදු ඉඩම්යාය | |
| 551 | ඌරලිය | ග්‍රාම සේවක කාර්යාලය ඌරලිය, දවුල්කුරුන්දවත්ත සහ හත්අඟාර විජේනායක මහතාට අයිති වත්ත | |
| 557 | තඹගල්ල | ග්‍රාම සේවක කාර්යාලය තඹගල්ල, පියසිරි විජේතුංග මහතාට අයිති ගල්වල වත්ත ඉහළ තඹගල්ල කොරයා වත්ත, දෙමටයිටිය කොහෝඹගහවත්ත, අංක 1 සහ තඹගල්ල වත්ත | සැම මසකම අඟහරුවාද දින |
| 566 | මැරවල | ග්‍රාම සේවක කාර්යාලය | |
| 577 | වෙරළබඩ | ග්‍රාම සේවක කාර්යාලය | |
| 536 | ඉහළගම | ග්‍රාම සේවක කාර්යාලය සහ ඉහළගම ගම් කාර්යාලය | |
| 545 | බිංගිරිය | ග්‍රාම සේවක කාර්යාලය බිංගිරිය, පිටර් අප්පුහාමි මහතාට අයිති බන්ඩිගහවත්ත, කාන්කඩවර හෙන්ද්‍රික් සිංඤෝ මහතාට අයිති පළුගහවත්ත සහ රත්මල්අඟාර පොල් පරික්ෂණාගාර වත්ත | |
| 552 | කරුක්කුවටවන | ග්‍රාම සේවක කාර්යාලය සහ රජ වත්ත අසල කුඹුක්ගහවත්ත | |
| 558 | මරදන්කුලම | ග්‍රාම සේවක කාර්යාලය මරදන්කුලම, කොහොඹවත්ත ඉහළ ඔලිඳළුව මන්සන්දිය අසල සහ මරදන්කුලම දෙමටවත්ත | සැම මසකම බදාද දින |
| 566ඒ | සවරාන | ග්‍රාම සේවක කාර්යාලය | |
| 580 | ඉච්චම්පිටිය | ග්‍රාම සේවක කාර්යාලය, බිෂොප් වත්ත, මාදුව වත්ත, පුවල වත්ත, ඉන්ද්‍රානි වත්ත, කිඹිල්ල වත්ත, දඳුරුඔය වත්ත, සන්ගත්තට්ටාන මහම්මදු කසීම් මහතා පදිංචි ඉඩම සහ වට්ටක්කලිය ස්මයිල් මහතා පදිංචි ඉඩම | |
| 537 | මරක්කලගම | ග්‍රාම සේවක කාර්යාලය | |
| 547 | මහගම | ග්‍රාම සේවක කාර්යාලය මහගම, බුළුගහ වත්ත සහ ඇලපහල බනිස් වත්ත | |
| 553 | සෙම්බුකට්ටිය | ග්‍රාම සේවක කාර්යාලය, හිටපු ගම්පති මහතා පදිංචි ඉඩම සහ මල්ලවආරච්චි මහතාගේ කඩය අසල ඉඩම | |
| 560 | පම්බල | ග්‍රාම සේවක කාර්යාලය පම්බල වත්ත, සහ පම්බල පාසැල ලඟ | |
| 564 | කරවිට | ග්‍රාම සේවක කාර්යාලය බ්‍රහ්මනදළුව, ජයසිංහ මහතාට අයිති ඉඩම ඉලිප්පදෙනිය ප්‍රේමදාස මහතාට අයිති නැකතිකොටුව වත්ත, ඉලිප්ප දෙනියේ දෙස්තරවත්ත, ඉලිප්පදෙනිය පුංචිරාල මහතාට අයිති වත්ත, මුංගන්දළුව පුංචිරිදී මමීට අයිති වැලියාල වත්ත | සැම මසකම බ්‍රහස්පතින්ද දින |
| 578 | පිටිපන | ග්‍රාම සේවක කාර්යාලය | |
| 540 | නෙළුම්පොකුණ | ග්‍රාම සේවක කාර්යාලය | |
| 548 | පුංචිවිලත්තව | ග්‍රාම සේවක කාර්යාලය සහ පුලියන්කඩවර පුංචිමැණිකේහාමිගේ ඉඩම | |
| 554 | කරුක්කුව | ග්‍රාම සේවක කාර්යාලය | |
| 561 | කාක්කාපල්ලිය | ග්‍රාම සේවක කාර්යාලය සහ වාලහේන පෙහෙකම් මධ්‍යස්ථානය | සැම මසකම සිකුරාද දින |
| 541 | මුගුණුවටවන ය : ප : | ග්‍රාම සේවක කාර්යාලය, පහළ දුම්මලසූරිය සුසාන භූමියට හැරෙන හන්දිය අසල ඉඩම | |
| 555 | සොන්නන්කන්නිය | ග්‍රාම සේවක කාර්යාලය සියඹලාගස්වෙල රෙජිස්ට්‍රාර් තැනගේ කාර්යාලය | |
| 549 | කොක්කාවිල | ග්‍රාම සේවක කාර්යාලය දහනෙවත්ත, කන්දෙවත්ත අංක 2 කොක්කාවිල උඩ බංගලාව වත්ත | |
| 562 | අඹකඳ විල | ග්‍රාම සේවක කාර්යාලය | |
| 369 | මුගුණුවටවන මු : ප : | ග්‍රාම සේවක කාර්යාලය පරුප්පාමුල්ල, පතිරාජ මහතා පදිංචි වත්ත ,රබෑපිටිය බදු ඉඩම්යාය, නරියාගම පොඩිඅප්පුහාමි මහතා පදිංචි ඉඩම, කන්පුක්කුලිය කේ. සිරිල් ප්‍රනාන්දු මහතා පදිංචි ඉඩම, ඌරළුඩයන්දළුව තිමෝති ලෝච් මහතා පදිංචි ඉඩම, දිවුල්ඔත ඩබ්ලිව්. කයිතන් මහතා පදිංචි ඉඩම | සැම මසකම සෙනසුරාද දින |
| 568 | මුන්නේස්සරම් | ග්‍රාම සේවක කාර්යාලය මුන්නේස්වරම, තේක්ක වත්ත බණ්ඩාර හේන වත්ත, තිස්සෝගම කට්ටි අංක 57 දරණ ඉඩම, නොච්චියවටවන වත්ත තිත්තකඩේ දිවුල්ලන්ද වත්ත, තිත්තකඩේ වත්ත සහ වටවන කැලේ වත්ත | |

### මහජන බැංකුව

**1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 30 වැනි වගන්තිය යටතේ යෝජනාව**

කෘෂිකර්ම හා කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ (402 වැනි අධිකාරය ප්‍රතිශෝධිත ව්‍යවස්ථා ප්‍රඥප්තිය 1956) 71 වැනි වගන්තිය සමග කියැවෙන 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 30 වැනි වගන්තිය යටතේ මහජන බැංකු අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 1973.02.22 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

"කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඇස්. ඇම්. ඩී. ජයසුන්දර මහතා විසින් මහජන බැංකුව නමට ලියා සහතික කරන ලද 3.11.69 දිනැති අංක 1168 දරණ උගස්කරය හා 11.11.71 දිනැති අංක 1734 දරණ උගස්කරය ප්‍රකාර කළයුතු වූ ගෙවීම් කඳානේ හල්පේ මාවතේ අංක 39 හි පදිංචි බෙන්තොට ගේ මුනිදාස ද සිල්වා විසින් පැහැර හැර ඇති හෙයින්ද එකී උගස්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්එක්දහස් තිස්එකයි ශත පණස් හයක (රු. 2,31,031.56) මුළු මුදලක් මහජන බැංකුවට ගෙවිය යුතුව ඇති හෙයින්ද, රු. 1,23,180 කට වර්ෂයකට සියයට 10 බැගින් හා රු. 1,00,000 වර්ෂයකට සියයට 11 බැගින් 1. 5. 72 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි ගාස්තු ද සමග එකී රු. 2,31,031.56 එම දිනට පසුව කිසියම් මුදලක් ගෙවා ඇත්නම් එය අඩුව අයකර ගැනීම සඳහා එකී අංක 1168 සහ 1734 දරණ උගස්කරයන් මගින් එකී බැංකුව වෙත උගස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකරු අර්ල්. එච්. නිකුලස් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1961 අංක 29 දරණ මහජන බැංකු පනත මගින් තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි."

**උකස් කරන ලද දේපොල පිළිබඳ විස්තර**

**මෙය ඉංග්‍රීසි පිටපතෙහි සිංහල අනුවාදයකි.**

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ වැලිසර පිහිටි මඟුල්පොකුණ නමැති ඉඩමට බලය ලත් මිනින්දෝරු ඒ. එච්. ප්‍රනාන්දු මහතා විසින් සකස් කරන ලද 29.12.1928 දිනැති අංක 1000 දරණ පිඹුරේ 'ඊ' අක්ෂරය යොදා ලකුණු කොට ඇති බිම් කැබැල්ල හා එහි පිහිටි ගොඩනැගිලි වගාවන් හා අනිකුත් සියළු දේ මීට අයත්වේ. මෙම ඉඩම් කැබැල්ල ඊසාන දිගින් නාගොඩ සිට රාගම දක්වා වැටී ඇති ගම්සභා පාරෙන්ද, ගිණිකොන දිගින් පාර හා වෙන් කළ බිමින්ද, ('ඩී' අක්ෂරය යෙදූ බිම් කැබැල්ල) නිරිත දිගින් ඇම්. දොන් ඇන්තනි සමරවික්‍රම ගේ උරුමක්කාරයන්ට අයත් දේපළින් ද, වයඹ දිගින් එම්. දොන් ගිරිගොරිස් සමරවික්‍රමට වෙන් කර ඇති 'එෆ්' අක්ෂරය යෙදූ ඉඩම් කැබැල්ලෙන් ද, මායිම් වී ඇති අතර, ඉහත කී අංක 1000 දරණ පිඹුරට අනුව අක්කර දහයයි පර්චස් තිස්හතරක (අක්. 10, රූඩ් 0, පර්චස් 34) ප්‍රමාණයෙන් යුක්ත වේ. ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී 70/164 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී වැලිසර පිහිටි මඟුල්පොකුණ නම් ඉඩමේ උතුරින් ගම්සභා පාරෙන්ද, නැගෙනහිරින් 'සී' අක්ෂරය යෙදූ ඉඩම් කැබැල්ලෙන්ද, දකුණින් එම්. ඩී. ඒ. සමරවික්‍රමගේ උරුමක්කාරයන්ට අයත් ඉඩමේ ඉතිරි කොටසින්ද, බටහිරින් 'ඊ' අක්ෂරය යෙදූ ඉඩම් කැබැල්ලෙන්ද මායිම් වන, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් අටක් (රූඩ් 1, පර්. 8) වන, අංක 1000 දරණ පිඹුරේ 'ඩී' අක්ෂරය යොදා ඇති ඉඩම් කැබැල්ල උඩින් වැටී ඇති මාර්ග අයිතිය මීට අයත්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
කේ. ඩී. කුලරත්න,
ප්‍රධාන කළමනාකරු.

(ඇජ්බී/248-242)
මහජන බැංකුව,
විදේශීය ශාඛාව,
බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 1,
1973 ජූනි මස 28 වෙනි දින.

7-461--73.07.13 දින අංක 68 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... 73.06.29 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... 73.07.06 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... 73.07.13 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... 73.07.20 | සිකුරාද | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... 73.07.27 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... 73.08.03 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... 73.08.10 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... 73.08.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... 73.08.24 | සිකුරාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි